# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,518—1965 සැප්තැම්බර් 30 වැනි බ්‍රහස්පතින්ද—1965.9.30

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම් ආදිය

**1965 අංක 368**

අ. ආ. කා. අංකය : සී. 162/49(5).

ක්‍රම සම්පාදක හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් ආචාර්ය ගාමිණී කොරයා මහතා දිවයිනට පෙරළා පැමිණෙන තුරු, අග්‍රාණ්ඩුකාරතුමන් විසින්, 1946 යේ හා 1947 තේ, ලංකා (ආණ්ඩුක්‍රම හා ස්වාධීනතා) රාජාඥාවල 51 වැනි වගන්තිය යටතේ, රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්, ඇම්. ජී. වී. පී. ඩබ්ලිව්. සමරසිංහ මහතා 1965 සැප්තැම්බර් 25 වැනි දින සිට, තම රාජකාරිවලට අමතරව ක්‍රම සම්පාදක හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වශයෙන් වැඩ බැලීමට පත් කළ බව මෙයින් දනුම් දෙනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

නි. විජේවර්ධන,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1965 සැප්තැම්බර් 30 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්‍යාලයේදී.

9–258

---

## ආණ්ඩුවේ නිවේදන

අ. ආ. කා. අංක එන්. 106/65

### පරීක්ෂණ කොමිෂන් සභා පනත

**ස. තො. ස. කොමිෂන් සභාව—කාලය දීර්ඝ කිරීම**

'සමුපකාර තොග වෙළඳ ආයතනයේ ක්‍රියාකාරිත්වය හා පාලනය සම්බන්ධයෙන් පරීක්ෂා කොට වාර්තා කිරීමේ කාර්යය සඳහා (1965 ජූනි මස 23 වෙනි දින අංක 14,432 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද 1965 ජූනි මස විසිතුන් වෙනි දින දරණ බලපත්‍රයෙන් වෙනස් කරනු ලැබූ) 1965 මැයි මස 7 වෙනි දින අංක 14,392 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කළ 1965 මැයි මස හය වෙනි දින දරන බලපත්‍රය මගින් (393 වෙනි අධිකාරය වන) පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 2 වෙනි වගන්තිය යටතේ පත් කරන ලද පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාව ඉදිරිපත් කිරීමේ කාලය එකී පනතේ 4 වෙනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල පාවිච්චි කරමින්, අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් 1966 මාර්තු මස තිස් එක් වෙනි දිනය තෙක් දීර්ඝ කර ඇති බව මහාජනයාගේ දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

නි. විජේවර්ධන,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1965 සැප්තැම්බර් මස 30 වෙනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්‍යාලයේ දී.

10–257

---

ඇල්.ඩී.—බී. 23/63.

### 1963 අංක 11 දරණ මුදල් පනත

වැඩබලන මුදල් ඇමති නන්එදිරි විමලසේන වන මම, 1963 අංක 11 දරන මුදල් පනතේ 30 (1) වැනි වගන්තියෙන් මා වෙත පවරා ඇති බලතල ප්‍රකාර, 1964 ජූලි 31 වැනි දින අංක 14,129 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ විනිමය බදු ආඥාවෙන් සංශෝධිත, 1964 ජනවාරි 10 වැනි දින අංක 13,915 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ, යටකී පනතේ 29 වැනි වගන්තිය යටතේ පනවනු ලැබූ විනිමය බදු ආඥාව 1965 ඔක්තෝබර් 1 වැනි දින සිට මේ ආඥාවෙන් අවලංගු කරමි.

ඇන්. විමලසේන,
වැඩබලන මුදල් ඇමති.

1965 සැප්තැම්බර් මස 29 දින
කොළඹ දීය.

9–256

---


ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි

1417—ආර් 9346—6,500 (9/65)